## - දැන්වීමයි -

## දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## දකුණු පළාත් තාක්ෂණ සේවයේ (සැලසුම් ශිල්පී) III ශ්‍රේණියේ / පුහුණු ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025

1.0 දකුණු පළාත් තාක්ෂණ සේවයේ (සැලසුම් ශිල්පී ) III ශ්‍රේණියේ / පුහුණු ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් **2025 නොවැම්බර්/ දෙසැම්බර්** මස පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.sp.gov.lk වෙබ් අඩවියේ පළකර ඇති අතර, අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (online) ක්‍රමයට පමණි. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2025 **ඔක්තෝම්බර් මස 24** වැනි දින වේ.

**සටහන 01 :- මාර්ගගත අයදුම්පත් භාරගැනීම 2025 ඔක්තෝම්බර් මස 03 වැනි දින පෙ.ව. 9.00 ට විවෘත වන අතර, 2025 ඔක්තෝම්බර් මස 24 වැනි දින ප.ව. 6.00 ට අවසන් වේ.**

මෙම විභාගය ගාල්ල, මාතර හා තංගල්ල යන නගරවල පිහිටුවන ලබන විභාග මධ්‍යස්ථානවල දී පමණක් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. සියලු අයදුම්කරුවන් එම නගර අනුව විභාගයට පෙනී සිටීමට බලාපොරොත්තුවන නගරය ලෙස තෝරාගත යුත්තේ අයදුම්කරුගේ ස්ථිර පදිංචිය ඇති දිස්ත්‍රික්කයේ ඉහත සඳහන් නගරයක් පමණි. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත නගරය නිවැරදිව සඳහන් කළ යුතු ය. විභාගයට පෙනී සිටීමට තෝරාගන්නා ලද නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. යම් නගරයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වූ විට විභාගය පවත්වනු ලබන නගර හෝ නගරය පිළිබඳ කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

2.0 දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්, තාක්ෂණ සේවයේ (සැලසුම් ශිල්පී ) III ශ්‍රේණියේ / පුහුණු ශ්‍රේණියේ තනතුර සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත.

3.0 (අ) **සම්පූර්ණ කිරීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාව 03 කි.**

(ආ) පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

(ඇ) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද අංක 222 හා 2017.05.24 දිනැතිව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද දකුණු පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවාව පිළිබඳව ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියම හා කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි / දකුණු පළාත් මුදල් රීති විධිවිධානවලට ද අංක 2310/29 සහ 2022.12.14 දින දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයන් තාක්ෂණ සේවයේ (සැලසුම් ශිල්පී ) III ශ්‍රේණියට/ පුහුණු ශ්‍රේණියේ තනතුරකට පත් කරනු ලැබේ.

(ඇ) පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් පළමු පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර තුනක් (03) අනිවාර්යයෙන් ම සේවය කළ යුතු ය. කෙසේ වෙතත් පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතූන් මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියෙකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම්, පත්කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.

(ඉ) මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ. තාක්ෂණ නිලධාරි (සැලසුම් ශිල්පී) III ශ්‍රේණියේ තනතුරකට බඳවා ගෙන වසර තුනක් (03) ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(ඊ) පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔබ පත්වීම සඳහා සුදුසුකම් සපුරාලූ භාෂා මාධ්‍යයට අනුව 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 සහ ඊට අනුෂාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව ඔබ විසින් අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතු වේ. තවද භාෂා ප්‍රවීණතාවය සම්බන්ධයෙන් බඳවා ගැනීමේ පටිපාටියෙහි විධිවිධාන අදාළ වේ.

## 4.0 වැටුප :-

(අ) III ශ්‍රේණියේ තනතුරට අදාළ වැටුප

2025.03.25 දිනැති හා අංක 10/2025 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN - 03 වැටුප් කේතයට මෙම තනතුරට හිමිවන අතර එයට අදාළ වැටුප් පරිමාණය 52,250 - 10 x 800 - 11 x 1,190 - 10 x 1,320 - 10 x 1,350 - 100,040/- වන අතර එම වැටුප ඔබට හිමිවන්නේ 2027.01.01 දින සිට වේ. පත්වීම ක්‍රියාත්මක වන දින සිට ඔබට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

(ආ) ඉහත චක්‍ර ලේඛය අනුව දකුණු පළාත් තාක්ෂණ සේවයේ පුහුණු කිරීමේ ශ්‍රේණිය සඳහා අදාළ වන මාසික දීමනාව පහත පරිදි වේ.

| වසර | මාසික දීමනාව | | |
|---|---|---|---|
| | 2025.04.01 දින සිට (රු.) | 2026.01.01 දින සිට (රු.) | 2027.01.01 දින සිට (රු.) |
| 1 වසර | 41,317.00 | 43,274.00 | 45,230.00 |
| 2 වසර | 41,689.00 | 43,730.00 | 45,770.00 |

**5.0** දකුණු පළාත් තාක්ෂණ නිලධාරි (සැලසුම් ශිල්පී) III ශ්‍රේණියේ තනතුර ස්ථිර ය, විශ්‍රාම වැටුප් සහිත ය. මෙම විභාගයෙන් තාක්ෂණ නිලධාරි (සැලසුම් ශිල්පී ) III ශ්‍රේණියට බඳවා ගනු ලබන නිලධාරීන්ට මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු වේ.

**සටහන 02 :-** පුහුණු කිරීමේ ශ්‍රේණියකට ඇතුළත් කර ගනු ලබන අයදුම්කරුවන් අදාළ බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පුහුණු කාල සීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විභාගය සමත් බවට නිකුත් කරනු ලබන සහතිකය ඉදිරිපත් කිරීමෙන් පසු සේවයේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත් වීමට අපොහොසත් වන ආධුනිකයින් වෙතොත් ඔවුනට මාස 6 කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාල සීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වන විවෘත ධාරාව යටතේ අයදුම්කළ ආධුනිකයින්ගේ සේවය අවසන් කරනු ලැබේ.

**6.0 සුදුසුකම් :-** දකුණු පළාත් තාක්ෂණ නිලධාරි (සැලසුම් ශිල්පී ) III ශ්‍රේණියේ/ පුහුණු ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට හෝ ඊට පෙර සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

## 6.1 III ශ්‍රේණිය

### (අ). අධ්‍යාපන සුදුසුකම් :-

ක්ෂේත්‍රයට අදාළ විෂයයන් දෙකක් සහිතව විද්‍යා/ ගණිත/ තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් අ.පො.ස.( උ/පෙළ) විභාගය එකවර සමත් ව තිබීම.

| තනතුර | අංශය | විෂයයන් | | |
|---|---|---|---|---|
| දකුණු පළාත් තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී | ගණිත අංශය | භෞතික විද්‍යාව | රසායන විද්‍යාව | සංයුක්ත ගණිතය |
| | විද්‍යා අංශය | | | ජීව විද්‍යාව |
| | තාක්ෂණවේදය | ඉංජිනේරු තාක්ෂණවේදය | තාක්ෂණවේදය සඳහා විද්‍යාව | ආර්ථික විද්‍යාව |
| | | | | භූගෝලය |
| | | | | ගෘහ ආර්ථික විද්‍යාව |
| | | | | ඉංග්‍රීසි භාෂාව |
| | | | | සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යනය |
| | | | | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය |
| | | | | චිත්‍ර |
| | | | | ව්‍යාපාර අධ්‍යනය |
| | | | | කෘෂි විද්‍යාව |
| | | | | ගණකාධිකරණය |

(ආර්ථික විද්‍යාව සිට ගණකාධිකරණය දක්වා) මෙම විෂයයන් අතුරින් එක් විෂයයක් හදාරා තිබිය යුතුය

සහ

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව,ගණිතය, සහ තවත් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් ව තිබීම.

### (ආ). වෘත්තීය සුදුසුකම් :-

i. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

ii. ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව

හෝ

iii. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව

හෝ

iv. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව.

හෝ

v. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම.

හෝ

vi. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තිය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

හෝ

vii. ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය හෝ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබිය හැකි ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සමාන හෝ උසස් සුදුසුකම් ලබා තිබීම.

**6.2 පුහුණු ශ්‍රේණිය ( එක් වසරක පුහුණු කාලය)**

**(අ). අධ්‍යාපන සුදුසුකම් :-**

ක්ෂේත්‍රයට අදාළ විෂයයන් දෙකක් සහිතව විද්‍යා (කෘෂි විද්‍යාව, ජීව විද්‍යාව හා කෘෂි තාක්ෂණවේදය) / ගණිත/ තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් අ.පො.ස. ( උසස් පෙළ) විභාගය එකවර සමත් වීම. හෝ ක්ෂේත්‍රයට අදාළ විෂයයන් සහිතව ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) 4 ලබා තිබීම.

සහ

සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම හෝ ජාතික වෘත්තීය සුදුසුකම ( NVQ) 3 ලබා තිබීම.

සහ

**(ආ). වෘත්තීය සුදුසකම් :-**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 මට්ටමට අදාළ වෘත්තීය සුදුසුකමක් සම්පූර්ණ කර තිබීම.

**6.3 පුහුණු ශ්‍රේණිය ( දෙවසරක පුහුණු කාලය)**

**(අ). අධ්‍යාපන සුදුසුකම් :-**

සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම හෝ ජාතික වෘත්තීය සුදුසුකම ( NVQ) 3 ලබා තිබීම.

සහ

**(ආ). වෘත්තීය සුදුසකම් :-**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්ත්‍රයක පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 මට්ටමට අදාළ වෘත්තීය සුදුසුකමක් සම්පූර්ණ කර තිබීම.

සටහන 03 -

i. III වන ශ්‍රේණියට සෘජුව බඳවා ගැනීම සහ පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීම යන ක්‍රම දෙකින්ම බඳවා ගන්නා විට බඳවා ගැනීමේ ශ්‍රේණිය වන III ශ්‍රේණියට පළමුව බඳවාගත යුතු ය.

ii. III වන ශ්‍රේණියට සුදුසුකම් ලබන අයදුම්කරුවන් සංඛාව පුරප්පාඩු සංඛ්‍යාවට ප්‍රමාණවත් නොවන විට, ඉතිරි පුරප්පාඩු සඳහා පුහුණු ශ්‍රේණියට අදාළ සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කරගනු ලැබේ.( පළමුව එක් වසරක පුහුණු ශ්‍රේණියට ද එක් වසරක පුහුණු ශ්‍රේණියට අයදුම්කරුවන් ප්‍රමාණවත් තරම් නොවන විට, දෙවසරක පුහුණු ශ්‍රේණියට ද බඳවා ගැනීමට සලකා බලනු ලැබේ)

**6.4 පළපුරුද්ද** :- අදාළ නොවේ

**6.5 වයස** :- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට එනම් 2025.10.24 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය. (ඒ අනුව 2007.10.24 දිනට හෝ ඊට පෙර හා 1995.10.03 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

**6.6 කායික සුදුසුකම්** :- දකුණු පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

**6.7 වෙනත්** :-

i. අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය.
ii. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
iii. විභාගය සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු අවසන් දිනට පූර්වයෙන් වූ අවුරුදු පහක් (05) ඇතුළත ඔහු/ ඇය ඉල්ලුම් කරන දිස්ත්‍රික්කය තුළ යටත් පිරිසෙයින් අවුරුදු තුනක් (03) වත් අඛණ්ඩව ස්ථිර වශයෙන් පදිංචිව සිටිය අයෙකු විය යුතු ය.

හෝ

විවාහය මත දකුණු පළාතට පදිංචිය වෙනස්වී ඇති අයදුම්කරුවෙකු නම්, විභාගය සඳහා සුදුසුකම් සම්පූර්ණ කළයුතු අවසන් දිනට පූර්වයෙන්, කලත්‍රයාගේ දකුණු පළාතේ පදිංචිය විවාහක දිනයේ සිට ලිත් වර්ෂ 03 ක් අතීතයට තිබිය යුතු ය.

iv. තනතුරට බඳවා ගැනීම සඳහා සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

v. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරණ කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

**7.0 විභාග පරිපාටිය** :- මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත් වේ. අයදුම්කරුවෙකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර, විභාගයට නියමිත සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන් ම පිළිතුරු සැපයිය යුතු ය. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ.

| විෂයය | කාලය පැය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය (Intelligence Quotient Test) | පැය 01 යි | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය (Subjective Technical Test) | පැය 02 යි | 100 | 40% |

## 7.1 විභාගය සඳහා වන විෂය නිර්දේශ පහත පරිදි වේ.

### 7.1 (අ) බුද්ධි පරීක්ෂණය

අපේක්ෂකයා සතු තර්කනය, ආදේශනය, අර්ථකථනය, සම්බන්ධතා දැකීම, පරිවර්තනය, ගැටලු විසඳීමේ හැකියාව, හේතුඵල සම්බන්ධතා අවබෝධ කර ගැනීම, පුරෝකථනය, තොරතුරු සංවිධානය, රටා හඳුනාගැනීම සහ උපදෙස් පිළිපැදීම ආදී හැකියා මැනීම සඳහා සකස් කරනු ලබන බහුවරණ වර්ගයේ ප්‍රශ්නවලින් බුද්ධි පරීක්ෂණය යුක්ත වේ.

### 7.1(ආ) විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය

#### 1.0 සැලසුම් ශිල්පය

1.1 ඉදිකිරීම් සැලැස්මක භාවිතා වන සම්මත සංකේත

1.2 සැලැස්මක භාවිතා වන ප්‍රක්ෂේපන වර්ග

1.3 ගොඩනැගිලිවල අත්තිවාරමේ සිට වහල දක්වා හරස් කඩ ව්‍යූහයන් පරිමානයට ඇඳීම හා දෙන ලද සැලැස්මකට වහලක් නිර්මාණය කර ඉදිරි හා පැති පෙනුම ඇඳීම

1.4 කොන්ක්‍රීට් අත්තිවාරම් වැරගැන්නුම් යෙදීමේ සැලැසුම ( කණු අත්තිවාරම, තලාද අත්තිවාරම)

1.5 දෙන ලද සැලැස්මකට අදාළ ඉදිරි පෙනුම, පැති පෙනුම, හරස් කඩ, අත්තිවාරම් විස්තරය, උළුවහු ජනෙල්වල ප්‍රමාණවල විස්තර සටහන්වල ව්‍යූහ ඇඳීම

1.6 ගොඩනැගිලි සැලසුම පිටපත් කිරීමේ දැනුම

#### 2.0 ගොඩනැගිලි නිර්මාණය

2.1 ගොඩනැගිල්ලක් සඳහා භාවිතා වන අත්තිවාරම් වර්ග, ගඩොල් වැඩ, කොන්ක්‍රීට් වැඩ, වහල වර්ග වල ආවරණ, ගොඩනැගිලි නිම කිරීම පිළිබඳ දැනුම

2.2 තරප්පු නිර්මාණය, දොර, ජනෙල් වර්ග නිර්මාණය

2.3 ගොඩනැගිලි ඉදිකිරීම පිළිබඳ නාගරික සංවර්ධන අධිකාරියේ හා පළාත් පාලන නීති පිළිබඳ දැනුම

#### 3.0 මැනීම හා මට්ටම් ගැනීම

3.1මට්ටම් ගැනීමට භාවිතා වන උපකරණ මට්ටම් පිටු පිළියෙළ කිරීම, මට්ටම් ගැනීම

3.2 බිම් මැනීමට භාවිතා වන ක්‍රම හා උපකරණ

3.3 බිම් මැනීම සඳහා දම්වැල් මැනුම තියොඩ ලයිට්ටු පරික්‍රමන (විවෘත/සංවෘත)

3.4 ක්ෂේත්‍රඵලය හා පරිමාව ගණනය

#### 4.0 ඉංජිනේරු ද්‍රව්‍ය

4.1ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා භාවිතා වන ද්‍රව්‍ය, භාවිතය හා ඒවායේ ප්‍රමිතිය සඳහා පරීක්ෂණය

#### 5.0 ගොඩනැගිලි සේවා

5.1 ජල සැපයුම, භාවිතා වන නල වර්ග, උපකරණ, කපාට කරාම

5.2 කසළ ජල අපහරණය පල්දෝරු ජලය අපවහනය, ජීව වර්ග කිරීම

5.3 සාධන කාමර සැලසුම් කිරීම

5.4 උණු ජල පද්ධති

8.0 **විභාග ප්‍රතිඵල** :- දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන **www.psc.sp.gov.lk** මඟින් එක් එක් අයදුම්කරුට පෞද්ගලිකව භාගත කර ගැනීමට හැකිවන පරිදි විභාග ප්‍රතිඵල නිකුත් කරනු ලබන අතර, විභාගය සමත් අයදුම්කරුවන්ගේ කුසලතා අනුපිළිවෙල අනුව සකස් කරන ලද නාම ලේඛනයක් පත්වීම් බලධරයා වෙත නිකුත් කරනු ලැබේ.

9.0 **විභාග ගාස්තු :-** විභාග ගාස්තුව රු. 1,000/- කි. මාර්ගගත ව (Online) විභාග ගාස්තු ගෙවිය යුතු වේ. සියලුම ගෙවීම් සිදුකළ යුත්තේ **VISA හෝ MASTER** කාඩ්පත් මඟින් පමණක් වන අතර, ඒ හැර වෙනත් ක්‍රමයක් මඟින් සිදු කරනු ලබන ගෙවීම් කිසිදු ආකාරයකින් පිළිගනු නොලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදල ම ගෙවිය යුතු වන අතර, විභාග ගාස්තුවවට වඩා අඩුවෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වගකියනු නොලැබේ.

කිසිඳු හේතුවක් මත ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව ද, එම ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩදෙනු නොලබන බව ද සැළකිය යුතු ය.

**සටහන 04 :-** අයදුම්පත් ඉදිරිපත් කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇතිවන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරුවන් විසින් විඳ දරාගත යුතු ය.

**10.0 අයදුම්කළ යුතු පිළිවෙල :-**

සියලුම අයදුම්කරුවන් **www.psc.sp.gov.lk** යන දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියට පිවිස විභාගය නිවැරදි ව තෝරා, අදාළ තොරතුරු ඇතුළත් කර විභාග ගාස්තු ගෙවීමෙන් පසු අයදුම්පත දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු (Submit) කළ යුතු ව ඇත. මෙම විභාගය සඳහා අයදුම් කිරීමේ කාල සීමාව **2025 ඔක්තෝම්බර් මස 24** වන දින ප.ව. **6.00** න් අවසන් වේ. (මේ සඳහා අන්තර්ජාල පහසුකම් සහිත Desktop හෝ Laptop පරිගණකයක් භාවිත කිරීම වඩාත් සුදුසු වේ.)

10.1 අයදුම්කරු විසින් ම මෙම විභාගය සඳහා තම අයදුම්පත්‍රය මාර්ගගතව සම්පූර්ණ කළ යුතු ය.

10.2 අයදුම්කරුවන් විසින් ඇතුළත් කරනු ලබන කිසිදු තොරතුරක් පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. එබැවින්, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු (Submit) කිරීමට පෙර එම තොරතුරු හොඳින් පරීක්ෂා කිරීම වැදගත් වනු ඇත.

10.3 වෙනත් ක්‍රම මඟින් ඉදිරිපත් කරන අයදුම්පත් සියල්ල දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. මාර්ගගතව මෙම විභාගය සඳහා අයදුම් කිරීමේදී වැරදි විභාගයක් තේරීම වැනි අතපසුවීම්වලින් සිදුවන පාඩුව ඔබ විසින් විඳදරා ගත යුතු වේ.

10.4 දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත මාර්ගගතව යොමු (Submit) කරන ලද අයදුම්පත බාගත (Download) කර එහි දෘඩ පිටපත (Hard Copy) **ඔක්තෝම්බර් මස 24** වන දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වන අතර, ඒ සමඟ කිසිදු ඇමුණුමක් නොඑවිය යුතු ය. එම දෘඪ පිටපත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ " **දකුණු පළාත් තාක්ෂණ සේවයේ (සැලසුම් ශිල්පී) III ශ්‍රේණියේ / පුහුණු ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025** " යන්න සඳහන් කිරීම අනිවාර්යය වේ.

**ලේකම්,**
**දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
**6 වන මහල ,දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය,**
**ගාල්ල.**

10.5 **අයදුම්පතෙහි අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :-**

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන බාගත කර ගන්නා ලද අයදුම්පතෙහි දෘඪ පිටපතේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු මඟින් ද එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු/ විශ්‍රාමික නිලධාරියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජා ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු හෝ මඟින් සහතික කරවා ගත යුතු ය.

11.0 **ප්‍රවේශ පත්‍ර :-**

මාර්ගගතව අයදුම්පත් කැඳවන බැවින්, සුදුසුකම් පරීක්ෂා කිරීමකින් තොරව නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත පරිදි විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර සෑම අතින් ම සම්පූර්ණ අයදුම්පත් මාර්ගගත ව ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට මෙම විවෘත තරග විභාගයට පෙනී සිටීමට දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිල වෙබ් අඩවිය වන **www.psc.sp.gov.lk** ඔස්සේ මාර්ගගත ව ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ නිවේදනයක් මඟින් ප්‍රසිද්ධ කරනු ලැබේ. ඒ අනුව වෙබ් අඩවියේ ඇති විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමේ කවුළුව වෙත පිවිස තම ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීමෙන් විභාග ප්‍රවේශ පත්‍රය බාගත කර ගත හැකි ය.

ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් අදාළ තීරුවෙහි සංශෝධනය වියයුතු ආකාරය නිවැරදිව සඳහන් කර අයදුම්කරුගේ අත්සන යෙදිය යුතු ය. සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතු ය. බාගත කර ගන්නා ලද විභාග ප්‍රවේශ පත්‍රය A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිත කරමින් මුද්‍රණය කර අත්සන සහතික කරවා ගෙන විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු මඟින් ද එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු/ විශ්‍රාමික නිලධාරියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියෙකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජා ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු හෝ මඟින් සහතික කරවා ගත යුතු ය.

12.0 **විභාගයට ඇතුළත් කර ගැනීම**

(අ) විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය පළමුවෙන් ම එම ශාලාවේ පෙනී සිටින විභාග දිනයේ දී එහි විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපතිවරයා

වෙත ඉදිරිපත් කළ යුතු ය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී ම විභාගයට පෙනී සිටිය යුතු ය.

13.0 **අපේක්ෂකයින්ගේ අනන්‍යතාව :-**
ප්‍රවේශ පත්‍රයක් නොමැති කිසිදු අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවස්ථාව නොලැබේ. තවද, අයදුම්කරුවන් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(i.) ජාතික හැඳුනුම්පත
(ii.) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii.) වලංගු රියදුරු බලපත්‍රය

විභාග අපේක්ෂකයින්ගේ අනන්‍යතාව තහවුරු කරගත හැකිවන පරිදි මුහුණ හා ඉලෙක්ට්‍රොනික සන්නිවේදන උපාංග පැළඳ ගෙන නොමැති බව සනාථ කිරීම සඳහා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

14.0 **තෝරා ගැනීමේ ක්‍රමය :-** මෙම තනතුරු සඳහා විභාගයෙන් දක්වන ලද කුසලතාවය අනුව සිදුකරනු ලබන සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයකින් (ලකුණු ලබාදෙනු නොලැබේ) පසුව සුදුස්සන් තෝරා ගනු ලැබේ. (පත්වීම් ප්‍රදානයේ දී පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව පත්වීම් දියයුතු අවසාන ප්‍රමුඛතා මට්ටමේ සම ලකුණු ලැබූ අයදුම්කරුවන් කිහිපදෙනෙකු සිටින අවස්ථාවක දී සම්මුඛ පරීක්ෂණයක් පවත්වා අධ්‍යාපන සුදුසුකම් අනුව ඉහළම සුදුසුකම් ඇති පුද්ගලයන් අනුපිළිවෙලින් තෝරා ගැනේ.)

15.0 **සාවද්‍ය තොරතුරු සැපයීම :-** මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ හෝ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත. තව ද, කිසියම් අපේක්ෂකයෙකු විසින් ඉදිරිපත් කරන ලද යම් තොරතුරක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කළ බව පෙනී ගියහොත් ඔහු හෝ ඇය සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කරනු ලැබේ.

i. අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයෙකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවක දී වුව ද ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට මෙම කොමිෂන් සභාවට බලය ඇත.

ii. අපේක්ෂකයෙකු විසින් සපයන ලද තොරතුරු පසු කලක දී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු/ ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහුට/ ඇයට පත්වීමක් ලබාදීම සම්බන්ධයෙන් තවදුරටත් සලකා බලනු නොලබන අතර මෙම විභාගය හේතු කොට ගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට වුව ද යටත් වේ.

16.0 විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

17.0 විභාගය පැවැත්වීම, විභාගය අවලංගු කිරීම හෝ විභාගයේ ප්‍රතිඵල අත්හිටුවීම සහ ඊට ආනුෂංගිකව විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති වෙනත් කවර හෝ කරුණක් සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේ ය. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

18.0 මෙම නිවේදනයේ සඳහන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**සී.පී. රාජකරුණා**
ලේකම්,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,

සී.පී. රාජකරුණා
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
දකුණු පළාත

2025 ඔක්තෝම්බර් මස 03 දින,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
6 වන මහල,
දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල,
ගාල්ල.

(මෙම දැන්වීම පදනම් කරගෙන විවිධ ආයතන විසින් සාවද්‍ය ලෙස සකස් කර ඉදිරිපත් කරනු ලබන දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කිසිදු වගකීමක් දරනු නොලැබේ.)